සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | | | |
|---|---|---|---|---|
| **සිංහල** | I | 71 | S | I |
| சிங்களம் | I | | | |
| Sinhala | I | | | |

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | |
|---|---|
| **අමතර කියවීම් කාලය** | - **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**
* **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන (**අ**), (**ආ**), (**ඉ**), (**ඊ**) හා (**උ**) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (**ඌ**) හා (**එ**) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(**අ**) ගල් පාවුළට ගිය කලට 'සොඳුර, මෙතැන් පටන් තොප හා මා හා යත් මුත් සෙස්සන් ගෙනයන්ට බැරි ය. බොහෝදෙනා ගෙනගිය කල කසළත් කෙරෙති. නවතාලියත් නොහැක්ක. දෙන්න පමණෙක් යම්හ. දෙවියන්ට පුදන්ට ගෙනයන දෙය බැවින් පිදේනිය තොපි ම අල්වාගනුව'යි කිවුය. උයිත් එලෙස ම කළහ. සොරාත් උන් කැඳවාගෙන සොරුන් හෙළන ගල උඩට නැංගේය. ඒ ගලටත් එක් දසාවෙකින් මිනිස්සු නැඟෙති. එක් දසාවක් ප්‍රපාත ව තිබෙන හෙයින් ගල්මුඳුනෙහි සිටලා එතැනින් සොරුන් හෙළති. උෟ කඩ කඩ ව බිම හෙති. එහෙයින් ඒ ගලට සොරපවුව යයි කියති. සිටුදූවණියෝ ද ගල මුඳුනේ සිට 'බිලියම් කරන්නැ'යි කිවුය. ඒ බැණ නොනැඟෙන්නේය. 'බැණ නොනැඟෙන්නේ හැයි දැ'යි විචාළ හෙයින් 'මට බිලියමින් කම් නැත. බිලියම් පිට ලාලා තොප මෙතැනට ගෙනෙන පිණිස ය'යි කීය. 'ගෙනායේ හැයි දැ'යි විචාළ කල්හි, 'තොප මරාපියා ආහරණ හැරගෙන පලායන්ට ය'යි කීය. උෟ තුමූ බා ගොසින් 'ස්වාමීනි, මාත් ආහරණත් මුඹ සන්තක වුව මරන්නේ හැයි ද? ආහරණත් හැරගතමැනව. මා අතිනුත් මෙහෙ හැරගතමැනවැ'යි කිවුය. ඒ කෙසේ කීවත් නොගිවිස ම මරන්ට ම තත්පර ව ගත. 'හැඟිවනු මැනව. මා මියයාමෙන් ප්‍රයෝජන නැත. ආහරණ හැරගෙන මාගෙනුත් **මිඬිකම්** හැරගතමැනවැ'යි කිවුය.

(i) මෙහි සඳහන් ස්ත්‍රිය, තමා නොමැරීමට හේතු සේ ඉදිරිපත් කළ කරුණු මොනවා ද?
(ii) දෙවියන්ට පූජා කිරීමට ගෙන යන දෙය හඳුන්වා ඇත්තේ කවර නමකින් ද?
(iii) "ඒ කෙසේ කීවත් නොගිවිස ම මරන්ට ම තත්පර ව ගත" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**මිඬිකම්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(**ආ**) එවේලෙහි රජකුමරුවන් **යත්යත්** උපාලි ආහරණ පොදිය අතින් අල්වාගෙන බලබලා සිට අනගි වූ සම්පතෙහි ඉතා භය ඇතිව ශාක්‍යයෝ නම් ඉතා ගුණ නපුරුහ. මේ සම්පත් හැරගෙන රාජ්‍යයට ගොස් මා මෙපවත් කී කල "සම්පත්තිලෝභයෙන් රජදරුවන් උගන්වාගෙන යවාපූයේ මේ කපුවා"යි මට කිපී මරා දමාපූ නම් නපුර; සම්පත් තබා දිවි ගලවා ගතොතින් යෙහෙක; මේ මට සැපතෙක් නොවෙයි, විපතට කාරණය; මෙවැනි රජුන් සැපත් හැර මහණ වන කල මා වැනියන්ට සැපතින් කම් නැත. මම ද ඔවුන් හා සමග ගොස් මහණ වෙමි'යි සිතා ආහරණ පොදියපිටින් ගසෙක එල්වා "පළමුව දුටු කෙනකුන් තෙලෙ හැරගන්නේය"යි අත් ගසා රජදරුවන් ගිය පදසලකුණෙන් දිව ගොස් රජකුමරුවන් හඹා ගියහ. එකල "අවුනැ"යි රජකුමරුවන් විචාළ කල තමන් ආ පවත් කියා "මම ද මහණ වෙමි"යි කීහ. රජකුමරුවෝ "තොප ආ සේ ම යෙහෙක වරෝය"යි කියා උනුදු කැඳවාගෙන ගොස් එකලට බුදුන් මල්ලරජුන්ගේ අනුපිය නම් නියම්ගම අනුපිය නම් වෙනෙහි වසන තෙනට ගොසින් බුදුන් දැක වැඳ එකත්පස්ව උන්හ. එකල ස්වාමිදරුවෝ ඔවුන් ආ කාරණා විචාරා මහණ වන්නට ආ බව අසා අවසර දුන්සේක.

(i) මේ ඡේදයට අනුව "මම ද මහණ වෙමි" යනුවෙන් ප්‍රකාශ කළ තැනැත්තා කවරෙක් ද?
(ii) ආහරණ පොදිය නිසා ජීවිත තර්ජනයක් එල්ල විය හැක්කේ කවුරුන්ගෙන් ද?
(iii) "රජදරුවන් ගිය පදසලකුණෙන් දිව ගොස් රජකුමරුවන් හඹා ගියහ." මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**යත්යත්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



(ඉ) කින්නරාඞ්ගනා ද ඔහු දැක "මේ සොරහු විසින් වූ සැටිය, මාගේ ස්වාමි පුරුෂයාණන් විදිනා ලද්දේය"යි භය සෝක දෙකින් වෙවුලමින් දිව ගොස් පර්වත මුදුනට නැගී රජහට **අවන්ට** පටන් ගත්හ. ඒ කෙසේ ද? යත්, "යම් රජෙක් මාගේ කැමති සමණන් කිසිලි මැද විද පී ද ඒ තෙම චිත් කා ශර වේගයෙන් තැති ගත්තේ විසංඥ ව බිම වැද හොත්තේය. අනේ මා දිව ගෙන ගොස් පර්වත මුදුනෙක ලා මේ සා දුඃඛයක් උපදවන ලද පාපිෂ්ට වූ තා වැනි ද්‍රෝහී මාගේ ස්වාමි පුත්‍රයාණන් මා උදෙසා මැරී නම් මාගේ ස්වාමි පුත්‍රයාට පැමිණි මරණ දුක්ඛය තට ද වේව යි මට පැමිණියා වූ මේ ශෝකය තාගේ අඹුදරුවන්ට ද වේව යි, තව ද දුෂ්ට වූ මහ රජ තාගේ ප්‍රජාපතී තොම තා ද තමන් දරුවන් ද නො දැක නිරා වදීව"යි යනාදීන් ඇවිලි අව අවා අඬන්ට පටන් ගත්හ. රජ්ජුරුවෝ ද මෙසේ හඬන්නිය, අස්වසන්නා වූ මහ බෝසත්හු චිත් කා අඬන වේලෙහි මා නම කියා හැඬූ හෙයින් නම දැන ද "ගින්නේර මල් බඳු ඇස් ඇති මනා වූ භාවභාව ලීලා විලාස ඇති චන්ද්‍රිකාව තෝ සෝක නො කරව. ඉදින් තෝ කැමති වී නම් මට බිරින්ද කොට සොළොස් දහසක් පුරාඞ්ගනාවන් මධ්‍යයෙහි රජකුලයෙහි ප්‍රසිද්ධව"යි කී හ. එපවත් අසා චන්ද්‍රිකා තොම "අවලක්ෂණ, තෝ මා නිසා නිරපරාධ වූ මාගේ සමණා මැරී ද? ඔහු කෙරේ ස්නේහයෙන් අඬා මියන පමණක් මුත් තොපට පාදපරිචාරිකා වීමෙක් ඒකාන්තයෙන් නොවෙයි," තද කොට කිව.

(i) රජුගේ ප්‍රකාශනයට චන්ද්‍රිකා ලබා දුන් අවසාන නිගමනය කුමක් ද?
(ii) රජතුමා කිඳුරියගේ නම 'චන්ද්‍රිකා' බව දැන ගත්තේ කෙසේ ද?
(iii) "මේ සා දුඃඛයක් උපදවන ලද පාපිෂ්ට වූ තා වැනි ද්‍රෝහී" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**අවන්ට**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) මෙසේ වෙළෙඳ භාර්‍යාවන් කී නොයෙක් කාරණ කටයුතු සියල්ල ම මෙහෙවරට ආ කෙළී ගොසින් අමාත්‍යයාට කිව. නැවතත් ඒ මෝහයෙන් මූඪ වූ අඥාන අමාත්‍යයා තමා ස්වභාවයෙන් ම මූඪ හෙයින් පළමු තුන්වාරයට වඩා පඬුරු දී කෙල්ල නික්මවිය. වෙළෙඳාණන්ගේ භාර්‍යාවෝ සතරවන වාරයේ පඬුරු ඇරගෙන ගිය එම කෙල්ල දැක "මේ ලජ්ජා නැති මිනිසෙක; දැන් මා ඔහු තද කොට කියා වැළකුව මැනවැ"යි සිතා කියන්නාහු "එම්බා, තොපගේ අමාත්‍යයාණෝ මිරිඟුදිය ගෙනවුත් කළ සැළ ආදියෙහි පුරා තබාගෙන ඉදින් ප්‍රයෝජන විඳිත් නමුත් ඒකාන්තයෙන් ම උන් හා මා හා සමාගමයෙක් නොවන්නේය. ඉදින් ශරත්කාලයෙහි වලාකඩක් ගෙන වැටියක් කොට අඹරාගෙන **වණ්ණු තෙලයෙන්** තෙමා තමාගේ ගෙය පහන් දල්වා ආලෝක පතුරුවාගෙන ඉන්නේ වී නුමුත් උන් හා සමඟ මාගේ සමාගමයෙක් නොවෙයි. තව ද නුග දිඹුල් ඇසතු ආදි වනස්පති වෘක්ෂයෝ පුෂ්පදාමයෙන් විභූෂිත ව මාගේ ගෙට තුමූ ම එන්නාහු වී නමුත් එබඳු අපූර්වයක් පැමිණි දවසෙකත් උන් හා මා හා සමාගමයෙක් නොවෙයි.

(i) වෙළෙඳ භාර්යාව සතර වන වරටත් තමා වෙත පඬුරු එවූ පුද්ගලයා හඳුන්වා ඇත්තේ කවර ප්‍රකාශනයකින් ද?
(ii) වෙළෙඳ භාර්යාව සහ අමාත්‍යයා අතර සමාගමයක් නොවන බව තහවුරු කිරීමට මෙහි විශේෂ ප්‍රකාශ කීයක් දක්වා තිබේ ද?
(iii) "නුග දිඹුල් ඇසතු ආදි වනස්පති වෘක්ෂයෝ පුෂ්පදාමයෙන් විභූෂිත ව" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**වණ්ණු තෙලයෙන්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(උ) ය ට සි න් ලන බැල්මෙන් **සුර විල** සී
වෙ සෙ සින් දනමන මත්කර එක සී
අ හ සි න් බැස රඟ ගත් රඟ කෙලෙ සී
දි සි මෙ න් විය විදුලිය සියදහ සී

දි මු තු යසස් වන් කුසුම සරා ගේ
නු මු තු සුවඳ මල් පැලඳ සරා ගේ
ද කි තු රඟන සුරඟන රඟ ලා ගේ
උ ම තු නොවෙද කෙලෙසක සිත කා ගේ

(i) කවුරුන්ගේ වුවත් සිත් උමතු කරවීමට හේතු වූ කාරණය කුමක් ද?
(ii) පළමු වන පද්‍යයේ දැක්වෙන උපමාව කුමක් ද?
(iii) "දිමුතු යසස් වන් කුසුම සරා ගේ" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**සුර විලසී**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

● (ඖ) සහ (ඵ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඖ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "එසේ වී නම් පින්වත්නි, තොප ඇම අප්‍රමාද ව මෛත්‍රීභාවනාව කරව"

(ii) "ඇයි මාගේ ස්වාමි පුරුෂයාණන් මී නියාවූ මගේ නැටුම් නොබලා වැදහෝනට කවර දුකෙක් උපන් ද?"

(iii) "බත් උපදිනේ බඩසලිනැ"

(iv) "අපට අනික් කවුරුනුත් නොකැමැත්තේ මුන් නොලදොත් මියමී"

(v) "සිරී, හොඳ සෝන්ග් එකක් ඇහෙනවා"

(vi) "මං ආපහු ගෙදර එන්ඩ ඕනැ අප්පොච්චී. මට බෑ මේ ගෙදර ඉන්ඩ."

(vii) "සරණ වූ නිමිත්තෙන ගුරුතුමා
මංගල විලාසයෙන්
කෙළිත්වා සිසුහු සැම,
අලස සුව විඳිත්වා ..."

(ලකුණු 03 × 4 = 12 යි.)

(ඵ) වස්තු විෂය හා භාෂා භාවිතය කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**දුරු රට ගිය පුතු**

හිරු එළිය ගලා එයි කුටියට
කවුළු පියන් පත් අතරින්
සුපුරුදු විලසින් ම
එහෙත් කිම
ඒ හිරු එළිය අද දින
මලානික වී
අවදි නොකරන්නේ මසිත

ඇසෙන නෙක විහඟ ගී නද
අලුයමින් පෙරදා ලෙස
රිදුම් දෙනු විනා මා සිත
නොගෙනෙන්නේ කිම ද කිසි මිහිරක්

පිපී අතු අග නෙක මල්
සැලෙනා නමුදු මඳ පවනේ
හද සැනසූ සුවඳ පෙර දින
නොදැනෙන්නේ කිම ද අද දින

වෙළා ගෙන මා ගත සිත
පාළුව ගලා විත් මා වට කොට
අත්මිදෙනු කෙලෙස ද
මේ රුදු පාළු හැඟුමින්

දුරු රටක ගිය මා පුතු
එන තුරු බලා හිඳිනට
හුරු කොට ගත යුතු නොවෙ ද
මා නෙතු
සඟවා වුව ද කඳුළැලි
දුරු රටක ගිය ඔහු
මා පුතු ද
මා හිත මිතුරු ද බැවින

(ලකුණු 12 යි.)

Past Papers Wiki



2. පුද්ගල චිත්තාභ්‍යන්තරයේ පවත්නා පොදු දුර්වලතා නිසා ඇති වන ව්‍යසන රසවත් ව ඉදිරිපත් කිරීමට සද්ධර්මරත්නාවලී කතුවරයා දැක්වූ දක්ෂතාව නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

**නැත හොත්**

"ඇතැම් විට ජාතක කථාවක දක්නට ලැබෙන්නේ සුළු පුවතක් වුවත් එහි කථා රසය පමණක් නො ව කිසියම් සාරධර්මයක් ද ගැබ් ව තිබේ." නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 15 යි.)

3. තම ශ්‍රාවකයා බුද්ධාලම්බන ප්‍රීතියෙන් උද්දාමයට පත් කරවමින් වෘත්තාන්ත රචනයෙහි ලා පූජාවලී කතුවරයාගේ නිර්මාණ කෞශල්‍යය නියමිත කථා වස්තු ආශ්‍රයෙන් පහදන්න.

**නැත හොත්**

"සිත් ඇදගන්නා වෘත්තාන්ත මාර්ගයෙන් සත්පුරුෂ ජනයා ධර්ම මාර්ගයට යොමු කිරීම සද්ධර්මාලංකාර කතුවරයාගේ පරමාර්ථය විය." නියමිත කථා වස්තු ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

4. (අ) "සිංහල සන්දේශාවලියේ ස්වර්ණමය අවධිය වන්නේ කෝට්ටේ රාජධානි සමය යි." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 07 යි.)

(ආ) "වැත්තෑවේ හිමියෝ රස නිෂ්පාදනයෙහි ලා අනුපම දක්ෂතාවක් ප්‍රකට කරති." මේ අදහස සුරඟන වැනුම ඇසුරෙන් පහදන්න. (ලකුණු 08 යි.)

5. බැහැරින් අවතීර්ණ වූ විවිධ බලපෑම් හේතුවෙන් ජන ජීවිතය විනාශ මුඛයට පත් වූ ආකාරය බැද්දේගම නවකතාව ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

6. "ළමා මනසෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත ව ජී. බී. සේනානායක වෙසක් පහන කෙටිකතාව නිර්මාණය කර ඇත." විමසන්න. (ලකුණු 15 යි.)

7. "නිදහස් කවියේ ද්විතීය තරංගයට/දෙවන පරපුරට අයත් කාව්‍ය නිර්මාණ මගින් කාලීන සමාජ යථාර්ථය මැනවින් නිරූපණය වේ." නිර්දිෂ්ට කාව්‍ය සංග්‍රහයෙහි අන්තර්ගත පද්‍ය පන්ති **තුනක්** ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

8. "මූලාශ්‍රයෙහි වූ නිර්මාණාත්මකභාවය විශිෂ්ට නාට්‍ය කෘතියක් බිහි කිරීම සඳහා කර්තෘවරයාට මනා පිටුබලයක් වූයේ ය." පෙමතො ජායතී සොකො නාට්‍යය ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 15 යි.)

* * *

53904

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | |
|---|---|
| සිංහල | II |
| சிங்களம் | II |
| Sinhala | II |

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**විභාග අංකය :** ..........................

**උපදෙස්:**

- ※ **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ※ **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 ඕෂ්ඨජ අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඤ, ණ, න, ත, ඉ, ම, ප  (2) බ, ධ, ඨ, ආ, ක, ච, ට

(3) ම, හ, බ, ඵ, ප, උ, ඌ  (4) ක, බ, ච, ට, ත, ඉ, ඊ

(5) ශ, ෂ, ස, හ, ෆ, ඍ, ඎ (......)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) සම්ප්‍රේශණය, කළටි, උච්චාවස්ථාව, බොළඳ, සුලැඟිල්ල

(2) සම්ප්‍රේෂණය, කලටි, උච්ඡාවස්ථාව, බොලඳ, සුළැඟිල්ල

(3) සම්ප්‍රේෂනය, කළටි, උච්චාවස්ථාව, බොළඳ, සුළැඟිල්ල

(4) සම්ප්‍රේසනය, කලටි, උච්ඡාවස්ථාව, බොලඳ, සුලැඟිල්ල

(5) සම්ප්‍රේෂණය, කළටි, උච්චාවස්ථාව, බොළඳ, සුළැඟිල්ල (......)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) පැරකුම්බා, විජයබාහු, කිත්සිරිමෙවන්, රාජසිංහ, දුටුගැමුණු

(2) කිත්සිරිමෙවන්, දුටුගැමුණු, පැරකුම්බා, රාජසිංහ, විජයබාහු

(3) කිත්සිරිමෙවන්, පැරකුම්බා, විජයබාහු, රාජසිංහ, දුටුගැමුණු

(4) විජයබාහු, දුටුගැමුණු, පැරකුම්බා, කිත්සිරිමෙවන්, රාජසිංහ

(5) රාජසිංහ, විජයබාහු, පැරකුම්බා, දුටුගැමුණු, කිත්සිරිමෙවන් (......)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) අනුස්වාර දෙකක් එක ළඟ එක යෙදිය හැකි ය.

(2) අනුස්වාරයට පිල්ලම් එකතු කළ හැකි ය.

(3) අනුස්වාරය ස්වරයකට පසු ව ම යෙදිය යුතු ය.

(4) අනුස්වාරය වචනයක මුලට යෙදේ.

(5) අනුස්වාරය ලිවීමේ දී 'අ' යන්නක් භාවිත කිරීම අනිවාර්ය ය. (......)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) ප්‍රායෝගික පරීක්ෂණ, අකාල වර්ෂාව, පුළුල් ක්ෂේත්‍රය, කාලීන අවශ්‍යතා

(2) කර්මාන්ත අමාත්‍ය, නිසල දිය, භූමි කම්පාව, ව්‍යවස්ථා විරෝධී

(3) තාක්ෂණික විෂය, වාචික පිළිතුරු, පාසල් අධ්‍යාපනය, වෘත්තීය සුදුසුකම්

(4) සෙල්ලම් ගෙය, විභාග ලකුණු, ආරාධනා පත්‍ර, ප්‍රාමාණික වියත්තු

(5) ද්විතීය අදියර, අන්තර්ගත කරුණු, ඉගෙනුම් කුසලතා, විදේශ රැකියා (......)

[දෙවැනි පිටුව බලන්න.

PAST PAPERS WIKI

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ශ්‍රමණ, විමන, භ්‍රමණ, අඟන
(2) භූෂණ, මෝරන, ධාරණ, රඟන
(3) විචාර, කුමාර, කෑදර, ප්‍රචාර
(4) අශ්ව, නිශ්චල, ආශ්චර්ය, විශ්ව
(5) විනාශ, ප්‍රකාශ, ප්‍රදේශ, දෑස (......)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සයුරු, කුරිරු, ගැඹුරු, ප්‍රවර
(2) ප්‍රහාර, තුසර, හසර, වසර
(3) අඹ, දඹ, ලඹ, තඹ
(4) දුහද, සුහද, විෂාද, ප්‍රසාද
(5) ආලාප, ප්‍රලාප, අලස, විලස (......)

1.8 කම් විබත්, සබඳ විබත්, කරණ විබත් සහ අවදි විබත් යන සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) හිරුැරැස්, මිණිපලඟ, ගත්කරු, ගිනිබිය
(2) ගත්කරු, ගිනිබිය, හිරුැරැස්, මිණිපලඟ
(3) මිණිපලඟ, ගිනිබිය, හිරුැරැස්, ගත්කරු
(4) ගිනිබිය, හිරුැරැස්, මිණිපලඟ, ගත්කරු
(5) ගත්කරු, හිරුැරැස්, මිණිපලඟ, ගිනිබිය (......)

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පූජිත, පෝෂිත, භාවිත, භාෂිත
(2) දරණ, පරණ, මරන, උරන
(3) දැරූ, පිරූ, බිරූ, නෙරූ
(4) විඳින, බිඳින, අඳින, බඳින
(5) පිපිරීම්, දෙදරීම්, මැතිරීම්, වැතිරීම් (......)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "**පාලා** ගිය වැනි බහුරූ කෝලම්"
(ආ) "**කියව** පුළුවන් ද වෙණ වැයුමා"
(ඉ) "**සැරද** හස රද සඳ"
(ඊ) "**බඳිමින්** දනමන නුවරූ"

(1) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(2) ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා
(4) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(5) විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා (......)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ, ධර්මිෂ්ඨ, කනිෂ්ඨ
(2) මාණික්‍යමය, ස්වර්ණමය, ශෛලමය, ලෝහමය
(3) සැහැලි, කැබැලි, වැදැලි, කෑදැලි
(4) යකකු, බඹකු, සොරකු, ඇතකු
(5) දෛනික, වෛකල්පික, නෛතික, ඓතිහාසික (......)

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) නිශ්ශබ්ද, නිශ්ශංක, නිශ්චල, නිශ්ශෝභා
(2) විගමන, විසංයෝග, විප්‍රයෝග, විසම්මුති
(3) ප්‍රමෝද, ප්‍රබෝධ, ප්‍රකම්පන, ප්‍රවර්ධන
(4) සුනීල, සුධීර, සුශීල, සුළඟ
(5) පිළිතුරු, පිළියම්, පිළිසකර, පිළිවදන් (......)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) මෙන්, විසින්, වෙනුවෙන්, සඳහා
(2) පිණිස, ලෙස, දෙස, මිස
(3) තුරු, වගේ, යළි, පටන්
(4) සහ, දක්වා, නිති, විනා
(5) කැටුව, ඉක්බිති, හැර, සමග (......)

[තුන්වැනි පිටුව බලන්න.

1.14 "තමාගේ රට පිළිබඳ **අභිමානය** ද **සෞභාග්‍යය** ද කෙනකුගේ **දේශානුරාගය** කෙරෙහි හේතු වේ." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) තද්ධිත, සන්ධි, උපසර්ග (2) සන්ධි, උපසර්ග, තද්ධිත
(3) සන්ධි, තද්ධිත, උපසර්ග (4) තද්ධිත, උපසර්ග, සන්ධි
(5) උපසර්ග, තද්ධිත, සන්ධි (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කෙරෙන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) ගසන්නෝ ය, දෙසන්නෝ ය, නසන්නෝ ය, අසන්නෝ ය
(2) දමාලා, නමාලා, වමාරා, හමනා
(3) පැන්නේ ය, ඇන්නේ ය, දෙන්නෝ ය, කන්නේ ය
(4) දෙති, ගති, එති, යති
(5) කළ, පල, බල, මළ (......)

1.16 සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සුබස්, සුමිත්, සුදම්, සුරත් (2) ළමාපොත්, මහලුනිවාස, බඳුසහන, අලිවැට
(3) අනදර, අරමුණු, අනලස, අනන්ත (4) සත්මහල්, තුන්දොස්, දසරජදම්, දෙනුවන්
(5) නෙතුපුල්, පාකමල්, හදවිමන, දම්අමා (......)

1.17 එක ම වර්ගයට අයත් **සන්ධි** පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පොල්ලත්ත, ගොක්කත්ත, අල්ලස, රුක්කත්තන
(2) උනුන්, ඔවුනොවුන්, සිහසුන්, මුලසුන්
(3) සුවැති, සිරිතැති, දැනුමැති, හදැති
(4) කොග්ගල, හග්ගල, උග්ගස්, දුග්ගන්නා
(5) සිද්ධාලේප, සහනාලේප, ප්‍රබන්ධෝපදේශ, ලලනාධිපත්‍යය (......)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය කුමක් ද?

(1) සුරැකුම්, සුදිලුම්, සුපැතුම්, සුසැදුම්
(2) නිරර්ථක, නිරපේක්ෂ, නිරාකුල, නිරුත්තර
(3) සරණ, ඉරන, වරන, කිරන
(4) විවාදාපන්න, ස්වරාරෝහණ, විරෝධාකල්ප, රාජ්‍යායතනය
(5) ත්‍යාගවන්ත, ප්‍රඥාවන්ත, ශ්‍රද්ධාවන්ත, ධනවන්ත (......)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) අසංවේදී පුද්ගලයෝ සමාජ හිතකාමීහු නො වෙති.
(2) නායකයෝ රටේ දියුණුව ඇති කරති'යි ජනතාව දෑස් දල්වා බලා සිටිති.
(3) ඉදිරියෙන් ම දුවන්නී අප පාසලේ ක්‍රීඩා නායකයා ය.
(4) මම මෙන් අනිකා වෙනුවෙන් කැප වී වැඩ කරන්න.
(5) අප සුදනන් මෙන් හැසිරිය යුත්තෙමු. (......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) අනුන්ගේ ඇද-කුද හොය හොයා ඉන්නෙපා.
(2) වහෙන් ඔරෝ නැතුව කියන දෙයක් කෙළින් කියන්න.
(3) අපාරාධකරුවා පෝරකයට නගිනු අපි බලා සිටියෙමු.
(4) අම්මයි තාත්තයි මායි අද උදේ පාන්දර ම වෙලට ගියා.
(5) මං කඩේ ගාවට යද්දී ඔක්කොම දුවගෙන ආවා. (......)

(ලකුණු 20 යි.)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | |
|---|---|
| සිංහල | II |
| சிங்களம் | II |
| Sinhala | II |

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** **(අ)** පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රටක වෘක්ෂලතාදිය ඇති වන්නේ එහි දේශගුණය, පස ආදි භූගෝලීය සාධකයන් මුල් කරගෙන ය. තව ද ඒ වෘක්ෂලතාදිය අනුව ඒ රටේ ඉතිහාසයත් එක්තරා ප්‍රමාණයකට හැඩ ගැසෙන බව ද කිව යුතු ය. මනුෂ්‍යාවාසයන් ඇති වී තිබෙන්නේ මිනිසාගේ පැවැත්ම සඳහා ඉවහල් වන වෘක්ෂලතාදිය පහසුවෙන් වගා කළ හැකි ප්‍රදේශවල ය. මිනිසා වෘක්ෂලතාදිය කෙරෙහි මුලින් ම සැලකිල්ල දැක්වූයේ ආහාර, වස්ත්‍ර සහ නිවාසස්ථාන ද සඳහා ඒවා ප්‍රයෝජනවත් වන බව පෙනුණු හෙයිනි. පසු ව ශාක විශේෂ කිහිපයක ඖෂධීය ගුණ ද අත්හදා බැලීම්වලින් සොයා ගන්නා ලදි. පුරාතන වෛද්‍යවරු දිවයිනේ සියලු බෙහෙත් පැළෑටිවල ම විස්තර දැක්වීමට වෑයම් කළහ. ඒ විස්තර නිඝණ්ඩු නමැති පොත්වල දක්නට ලැබෙයි.

මිනිසා අවට ඇති මල් ගස්වල සහ මල් පඳුරුවල ද සුන්දරත්වයත් සුගන්ධයත් ඔහුගේ සෞන්දර්ය හැඟීම දියුණු වීමට ඉවහල් විය. ශාක ලෝකයේ දක්නට ලැබෙන ගුඪ ස්වභාවය මිනිස් සිතෙහි ආගමික හැඟීම් පැන නැගීමට හේතු වන කරුණුවලින් එකකි. භාවනාවට ඉතා සුදුසු තත්ත්වය ශාන්ත, නිශ්චල වනයෙහි ඇති බව දාර්ශනිකයා දුටුවේ ය. උද්‍යානයේ සෞන්දර්යය කවියා කුල්මත් කරන සුලු ය. එහෙයින් මේ පොතේ අග පරිච්ඡේදවලින් අනාවරණය කරනු ලබන සියවස් ගණනක ඉතිහාසයට සම්බන්ධ පුද්ගලයන්ට ස්වභාව ධර්මය විසින් මග පිළියෙල කර දෙනු ලැබූ අයුරු සලකා බැලීම මේ දිවයිනේ ඉතිහාසය හදාරන්නන්ගේ යුතුකමකි.

පහත රට සදාහරිත වැසි වනාන්තර වනාහි මහල් කිහිපයක් ඇති ඝන උද්භිද ප්‍රජාවකි. මෙහි ඇතැම් ප්‍රමුඛයෝ වනහිස විනිවිද වැඩෙති. ඔවුහු උසින් අඩි 100කට ද වැඩි වෙති. මේ ගස්වල පාමුල දක්නට ලැබෙන ලක්ෂණයක් නම් කයිරු ඇති වීම ය.

(i) මිනිසා වෘක්ෂලතාදිය කෙරෙහි මුලින් ම සැලකිල්ල දැක්වූයේ කවර හේතු නිසා ද?

(ii) මේ ඡේදයට අනුව අඩි 100කට වඩා උසින් යුත් ගස්වල ඇති ලක්ෂණය කුමක් ද?

(iii) රටක වෘක්ෂලතාදිය හට ගැනීමට බලපාන සාධක කීයක් මෙහි දැක්වේ ද?

(iv) පහත රට සදාහරිත වැසි වනාන්තර මෙහි හඳුන්වා ඇත්තේ කවර ආකාරයෙන් ද?

(v) මේ ඡේදයෙහි දැක්වෙන ආකාරයට නිඝණ්ඩු නම් කෘති විශේෂයෙහි අන්තර්ගත වන්නේ මොනවා ද?

(vi) මිනිස් සිතෙහි ආගමික හැඟීම් පැන නැගීමට බලපෑ හේතු සාධකය ලෙස මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(ලකුණු 02 × 6 =12 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සිංහල කවිය පිළිබඳ ව පැහැදිලි චිත්‍රයක් මතුකර ගත හැකි මුල් ම කාව්‍ය සංග්‍රහය ලෙස සීගිරි කැටපත් පවුරේ සටහන් කොට ඇති ගී සමුච්චය හැඳින්විය හැකි ය. ඉන් වැඩි කොටසක් කිතුවසින් අටවන, නවවන හා දසවන සියවස්වල හෙවත් අනුරාධපුර යුගයේ අවසාන භාගයට අයත් ය. සීගිරියේ කැටපත් පවුරේ කුරුටුගා ඇති මෙම ගීවලින් කියවෙන්නේ සීගිරිය නැරඹීම සඳහා දිවයිනේ නා නා පෙදෙසින් පැමිණි රසඥයන් එහි බිත්තිවල සිත්තම් කළ කතුන් දැකීමෙන් ද අවට පැතිර පැවති ශෝභාවට වශීකෘත වීමෙන් ද සිය හදවත්වල ජනිත වූ මනෝභාව ගීයට නැංවීමෙන් මෙම පද්‍යාවලිය බිහි වී ඇති බව ය. මේ පද්‍ය අතර එළිසම කොට බඳනා ලද පද්‍ය කිහිපයක් ද දක්නට ලැබේ. එහෙත් පද්‍ය වැඩි සංඛ්‍යාවක් ම 'ගී' නම් විරිතින් රචනා කොට තිබේ. මේ හැරෙන්නට යහ ගී, පියුම් ගී, මත්වල ගී, කව් ගී, උමතු ගී, දුවග ගී, යොන් ගී ආදි විරිත්වලින් බඳනා ලද පද්‍ය වේ.

මෙසේ නොයෙක් ගී විරිත්වලට අනුව කුරුටුගාන ලද ගී 685ක් පරණවිතාන සූරීන් විසින් පිටපත් කොට ප්‍රකාශනයට පත් කරනු ලැබ තිබේ. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ නම් පද්‍ය රචනයෙහි ලා එදා සමාජයේ කෙතරම් වැදගත් තැනක් පැවතුණේ ද යන්න යි. යම් වස්තුවක සුන්දරත්වයෙන් කුල්මත් ව තමා වින්දනය කළ සුන්දරත්වය පද්‍යයක විලාසයෙන් ඉදිරිපත් කිරීමෙහි කවීන් නිරත වූ සමාජයක තතු සීගිරි කවිවලින් කියැවේ. කාව්‍ය රචනය මෙතරම් ප්‍රචලිත වූ සමාජයක් එදා පැවතියේ මුද්‍රණ ශිල්පය, පුවත්පත් වැනි පහසුකම් නොතිබුණු අවස්ථාවක බව සිතන විට ලාංකේය ජනතාව කෙතරම් දුරට කලාත්මක චින්තනය අතින් සංවර්ධනය වී සිටියේ ද යන්න මනාව වටහා ගත හැකි ය.

(ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ඩිජිටල්කරණය මගින් අත්විය හැකි යහපත් සහ අයහපත් ඵලවිපාක
(ii) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ශ්‍රී ලංකාවේ අනාගත අපේක්ෂා
(iii) මෙරට ළමා සාහිත්‍ය නිර්මාණකරුවන්ට විධිමත් පුහුණුවක් ලබාදීමේ අවශ්‍යතාව
(iv) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය නගා සිටුවීමට අනුගමනය කළ යුතු අභිනව ක්‍රමෝපාය
(v) අඩු ආදායම්ලාභීන්ට අඛණ්ඩ ව මූල්‍යාධාර ප්‍රදානය කිරීමේ උචිත-අනුචිතභාවය

(ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් පමණක් නිදොස් කොට ලියන්න. නිදොස් නම් එම වාක්‍යය නැවත ලියන්න.

(i) හෙළයේ මහ ගත්කරු නොහොත් මාර්ටින් වික්‍රමසිංහ 'මඩොල්දූව' රචනා කළේ ය.
(ii) නිදහස් සටනට පණ පෙවූවෝ ජාතික වීරයන් වෙති.
(iii) විභාග ශාලාවෙහි නිරීක්ෂකයෝ ඇත.
(iv) අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ශිෂ්‍යයෝ ඇගයීමට ලක් කෙරෙති.
(v) රටවැසියනි, අසරණ පිළිකා රෝගීහු උදෙසා මුදලක් පරිත්‍යාග කරන්න.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) සමහරු වගකිව යුතු තනතුරු සඳහා තම අනුගාමිකයන් පත් කරති.
(ii) ළමයි මේ දිනවල සරුංගල් සාදති.
(iii) රජතුමා තොප යුද පෙරමුණට යැව්වේ ය.
(iv) වංචනිකයෝ කිහිප වතාවක් අප මුළාවේ හෙළුවෝ ය.
(v) ඔවුහු ගුණදාස අමරසේකර සූරීන් සම්මානයකින් පුදති.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) සමාජ (සේවකයෝ/සේවකයන්) රටට හිත වැඩ (කරන්නෝ/කරන්නන්) වෙති.
(ii) ගුරුවරයෙක් ද ගුරුවරියක් ද (මම ද/නුඹ ද) උත්සවයට සහභාගි (වෙමු/වෙහි.)
(iii) විදේශීය (නැවියන්/නැවියෝ) වරායට සේන්දු වී (ඇත/ඇත්තේ ය.)
(iv) (මා/මම) අනාගතය නුවණින් (දකිමි'යි/දකිති'යි) උපදේශකයෝ සිතති.
(v) (දරුවකු/දරුවෙක්) මිස (වැඩිහිටියෙක්/වැඩිහිටියකු) මේ ක්‍රියාව නො කරයි.

(ලකුණු 05 × 3 =15 යි.)

Past Papers Wiki



5. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **අටලෝදහම** හමුවෙහි කම්පිත **නොවන්නෝ** තාදි **ගුණැත්තෝ** ය.
(**අටලෝදහම** - සමාස, **නොවන්නෝ** - විභක්ති, **ගුණැත්තෝ** - සන්ධි)

(ii) **නනබරණින් සැරසුණු රූමත්** අංගනාවෝ වීථියෙහි නිබඳ ව සැරිසැරූහ.
(**නනබරණින්** - සන්ධි, **සැරසුණු** - කෘදන්ත, **රූමත්** - තද්ධිත)

(iii) කපුවන් **දෙවියන් යදිද්දී** බැතිමත්තු දොහොත් මුදුන් **දී** වඳිති.
(**දෙවියන්** - විභක්ති, **යදිද්දී** - අසම්භාව්‍ය ක්‍රියා, **දී** - ක්‍රියා)

(iv) **ප්‍රේමියේ,** සෙනෙහෙ සඳරැස් **වැද හඳකුමුද** පුබුදූ වේවා!
(**ප්‍රේමියේ** - විභක්ති, **වැද** - ක්‍රියා, **හඳකුමුද** - සමාස)

(v) **නිමල** පුලිනතල මත සසල ව **හැපෙන** දළරළ පෙළ **සවනත** පිණවයි.
(**නිමල** - උපසර්ග, **හැපෙන** - කෘදන්ත, **සවනත** - තද්ධිත) (ලකුණු 03 × 5 =15 යි.)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) ..................... මෙටක් වෙනුවෙන් අපි දිවා රෑ නො නිදා බලා සිටිමු.

(ii) ඒ වෙස් ........................ උලෙළ වනාහි සැම දෙනාගේ ම කැපවීමේ අග්‍රඵලයකි.

(iii) සන්ධ්‍යා යාමයේ තැන් තැන්වල වූ ........................ සෙවණැලි පාළු මූසල බවක් ඉසිලී ය.

(iv) නීරෝගී ශරීරයක් මෙන් ම ........................ මනසක් ද පුද්ගලයකුට තිබිය යුතු ය.

(v) ඒ ........................ රාත්‍රිය භයානක ශබ්දයන්ගෙන් පිරී පැවතුණේ ය.

(vi) සියලු නළුනිළියෝ ඒ මහා ........................ ප්‍රසංගයට සහභාගි වූහ.

(සුපසන්, අන්ධකාර, නර්තන, ප්‍රසන්න, අඳුරු, නැටුම්)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

'කොරන්නෝනෙයි කිව්වට ඔච්ච කොරන්න ඇහැක් වැඩය,' (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) තොටියා **හබලෙන් ඔරුව** පැද්දේ ය.

(ii) යාචකයා **ගමින්** ගමට ගොස් **මුදල්** එකතු කළේ ය.

(iii) **මාගේ** ව්‍යාකරණ පොත **රාක්කයෙහි** ඇත. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

"වර පුරුෂය තෝ කොහි සිට මෙහි පැමිණියෙහි ද මාරයාගේ කටට වැද ඉන් බේරී පලා යාමට තරම් තා පින්කර නැත. "අනේ මාහට සමාව දෙනු මැනවයි වර පුරුෂයා බැගෑපත් ව ඉල්ලා සිටියේ ය.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම හොඳින් ඉගෙන වෛද්‍යවරයෙක් වෙමි"යි ළමයා පැවසී ය.

(ii) "ක්‍රීඩකයෝ ඊයේ තරගයෙන් ජය ලැබූහ"යි ක්‍රීඩා නිලධාරියා කී ය.

(iii) "අපි අපේ පොත් ශිෂ්‍යයන්ට දෙමු"යි ලේඛකයෝ ප්‍රකාශ කළහ.

(ලකුණු 01 × 3 = 03 යි.)

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එදින නන්ද කුමාරයන්ට ජීවිතයේ **අතිශය** වැදගත් දිනයක් ම වූයේ ය. ඒ ඔහුගේ විවාහෝත්සවය, ගෘහප්‍රවේශෝත්සවය සහ **අභිෂේකෝත්සවය** යන ත්‍රිමංගල්‍යය ම යෙදී තිබුණු බැවිනි. බුදුපියාණෝ එදින මාලිගයට වැඩම කොට දානය වළඳා අන්තයෙහි තම පාත්‍රය නන්දගේ අතට දී එය ද රැගෙන පසුපසින් එන ලෙස පැවසූහ. නන්ද කුමාරයෝ බුද්ධ ගෞරවයෙන් පාත්‍රය ද ගෙන උන්වහන්සේ සමග ම විහාරයට ගියහ.

නන්දයන්ගේ **අනාගත** ප්‍රියාම්බිකාව වීමට සිටියේ ජනපද කල්‍යාණිය යි. ඒ **අභිරූපිකාවෝ** දුටු දුටුවන් මනනුවන් පැහැර ගන්නා රූපශෝභාවෙන් සමලංකෘත්‍යෝ ය; නා ළපල්ලට සරදම් කරන සුලු වූ අධර යුග්මයෙන් **අලංකෘතයෝ** ය; සුපුල් පියුම පරදවන සුරත් මුවමඬලින් **අභිරමණීයෝ** ය; වට, මට පැටි හසුන් නමැති තනහසුන්ගෙන් සාලංකෘතයෝ ය; බැලූවන් නෙතුයුග ඇද බැඳ ගන්නා සිහිනිඟින් හා පුළුලුකුලින් මනහරයෝ ය; සැබවින් ම මිහිබට දෙවඟනක හා සදිසියෝ ය.

බුදුන් පසුපස ගිය ද නන්දගේ සිත්හි වූයේ සිය ප්‍රියාව පිළිබඳ මතකය යි. "නන්දයෙනි, ඔබ මහණ වීමට කැමති ද?" යි බුදුන් වහන්සේ විමසූ සේක. නන්දයෝ අපරිමිත ගෞරවයෙන් "එසේ ය ස්වාමීනී" යි කීහ. මහණ වුව ද ඔහුගේ සිත්හි පැතිර සිටියේ භාවනාව සම්බන්ධ කර්මස්ථාන නො ව ජනපද කල්‍යාණිය සම්බන්ධ **අතීත** ස්මරණයන් ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පටිපාටියෙන් ලියන්න.

(ii) මෙහි ඇති ස්වර සන්ධි පද **තුනක්** උපුටා දක්වන්න.

(iii) පැවසූහ, කැමති, ගෞරවයෙන් යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iv) ඡේදයේ ඇතුළත් ප්‍රථම පුරුෂ, අතීතකාල, බහුවචන ආඛ්‍යාත පද **තුනක්** උපුටා දක්වන්න.

(v) මෙහි ඇති ඝෝෂ මහාප්‍රාණයක් හා මූර්ධජ ව්‍යඤ්ජන **දෙකක්** සහිත පදයක් ලියන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මහාප්‍රාණාක්ෂර

(ii) ගෞරවාර්ථයේ 'ආණ, අණු, අණි' ප්‍රත්‍යය

(iii) අවධි විභක්ති සමාසය

(iv) ඛේදාර්ථයේ නිපාත

(v) වර්තමාන කාල, මධ්‍යම පුරුෂ ක්‍රියාරූප

(ලකුණු 05 × 3 =15 යි.)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki